දිවි අහිමි කරගැනීමක් සම්බන්ධයෙන් සන්ඩේ ඔබ්සර්වර් පුවත්පතේ පළව තිබූ ලිපියක් සමාජ මාධ්‍ය තුළ විශාල අවධානයකට ලක්වූ අතර, බොහෝ දෙනෙකු එය අපගේ අවධානයටද යොමු කර තිබිණි.

දිවි අහිමි කරගැනීම් නම් සමාජ ප්‍රශ්නය අවම කිරීමට ඇති මාර්ගය වන්නේ වින්දිතයාට දෝෂාරෝපණය කිරීම හෝ ගර්හාවට ලක් කිරීම නොවේ. විශේෂයෙන්ම මාධ්‍ය මගින් දිවි අහිමි කරගැනීම් වාර්තා කරනා විට, අනුකාරක දිවි අහිමි කරගැනීම් අවම කිරීමට ඇති මාර්ගය වන්නේ ඒ සම්බන්ධයෙන් වන මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුගත වීම බව ඒ පිළිබඳ ජාත්‍යන්තර මාර්ගෝපදේශයන් මගින් පෙන්වා දේ.

කෙසේ නමුත් සන්ඩේ ඔබ්සර්වර් පුවත් වාර්තාව එම ආචාර ධර්මයන්ට අනුගත වී නැත. මෙහි සිරස්තලය වී ඇත්තේ "30-year-old man opts for easy way out" යන්නයි. මෙහිදී අපගේ නිරීක්ෂණයන් මෙසේ දක්වමු.

1) දිවි අහිමි කරගැනීමක් යනු පහසු මාර්ගයක් තෝරාගැනීමක් ලෙසින් දැක්වීම වින්දිතයාට දෝෂාරෝපණය කිරීමක් නොවන්නේද?

2) මෙහි වින්දිත රෝගියාව රෝහලට කැටුව ගිය අය 'Accomplice' නැතිනම් 'අපරාධයක/වරදක සහායකයෙකු' ලෙසින් හැඳින්වීම අයෝග්‍ය හා ගැටළුකාරී නොවේද?

3) දිවි අහිමි කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තාවන් හා සැමවිටම හදිසි උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට ඉඩක් ලැබෙනුයේ නොවේද?

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස්ද අපි අගය කරන්නෙමු.

මූලාශ්‍ර:

https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=55237240456D70AC099D3B9F7B2B10DB?sequence=1

https://media.samaritans.org/documents/Samaritans_Media_Guidelines_UK_Apr17_Final_web.pdf

#MediaEthicsSL #lka #EnglishPress #Sundayobserver